පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 11


**පාඩම :- කෝණ**

**කාලච්ඡේද ගණන :- 04**

- පෙළපොතේ 84, 85 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.





.AB සරල රේඛා ඛණ්ඩය








PQ වක්‍ර රේඛා ඛණ්ඩය

**සරල රේඛා ඛණ්ඩ දෙකක් හමුවීමෙන් කෝණය සෑදේ. එම සරල රේඛා ඛණ්ඩ දෙක හමුවන ලක්ෂ්‍යය, කෝණයේ ශීර්ෂය නම් වන අතර එම සරල රේඛා ඛණ්ඩ, කෝණයේ බාහු ලෙස හඳුන්වයි.**





පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| රූපය | කෝණයක් ඇත / නැත |
|---|---|
|  | |
|  | |
|  | |
|  | |

- අප අවට නිරීක්ෂණයේදී කෝණ දැක ගත හැකි අවස්ථා 5 ක් ලියන්න.
- පෙළපොතේ 85 පිටුවේ ක්‍රියාකාරකම 1 නිවැරදිව අධ්‍යයනය කරන්න.
- පෙළපොතේ 86 පිටුවේ 7.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.


- පෙළපොතේ 87 හා 88 පිටු නිවැරදිව අධ්‍යයනය කරන්න.
- එහි දැක්වෙන ක්‍රියාකාරකම 2 හා ක්‍රියාකාරකම 3 නිවැරදිව අවබෝධ කර ගන්න.
- සෘජුකෝණ හැඩය අඳින්න.



සෘජුකෝණය


- ඔරලෝසු මුහුණතක සෘජුකෝණයක හැඩය ලැබෙන අවස්ථා පැය කටුව හා මිනිත්තු කටුව අනුව ඇඳ දක්වන්න.

උදා:-





- අප අවට පරිසරය නිරීක්ෂණයේදී සෘජුකෝණයක හැඩය දැක ගත හැකි අවස්ථා 5 ක් ලියන්න.
- පෙළපොතේ 89 පිටුවේ 7.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
- පෙළපොතේ 90 පිටුව නිවැරදිව අධ්‍යයනය කරන්න.

සුළු කෝණය, සරල කෝණය, මහා කෝණය, පරාවර්ත කෝණය යන එක් එක් කෝණය සෘජුකෝණය ඇසුරින් වර්ග කරන්න.




විශාලත්වයෙන් සෘජුකෝණයට වඩා අඩු කෝණය


**සුළු කෝණය**



විශාලත්වයෙන් සෘජුකෝණ දෙකක විශාලත්වයට සමාන කෝණය




**සරල කෝණය**



විශාලත්වයෙන්
සෘජුකෝණයට වඩා වැඩි
එහෙත් සරල කෝණයට වඩා
අඩු කෝණය

**මහා කෝණය**





විශාලත්වයෙන් සරල කෝණයට
වඩා වැඩි එහෙත් සෘජුකෝණ හතරක
විශාලත්වයට වඩා අඩු කෝණය


**පරාවර්ත කෝණය**


පෙළපොතේ 90, 91 පිටුවල දැක්වෙන ක්‍රියාකාරකම 4 නිවැරදිව අවබෝධ කරගන්න.


පහත ඔරලෝසු මුහුණත්වල දැක්වෙන කෝණ ලියන්න.




පහත දැක්වෙන ඉංග්‍රීසි හෝඩියේ අක්ෂරවල දක්නට ලැබෙන කෝණයන් ලියා දක්වන්න.

# A, E, H, L, M, T, V, W, Y

පෙළපොතේ 91, 92, 93 පිටුවල ඇති 7.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.